# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2121/36 - 2019 අප්‍රේල් මස 30 වැනි අඟහරුවාදා - 2019.04.30**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා මිනින්දෝරු සේවය පිළිබඳ ව්‍යවස්ථාවෙහි 7.3 ඡේදය සංශෝධනය කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2006.02.27 දිනැති අංක 1434/5 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* මඟින් පළකරන ලද සහ 2007 ජනවාරි 31 දිනැති අංක 1482/17 දරන, 2007 අගෝස්තු 10 දිනැති අංක 1509/15 දරන, 2009 ඔක්තෝබර් 15 දිනැති අංක 1623/13 දරන, 2010 මැයි 20 දිනැති අංක 1654/13 දරන, 2010 ඔක්තෝබර් 12 දිනැති අංක 1675/20 දරන සහ 2017 ඔක්තෝබර් 24 දිනැති අංක 2042/12 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍ර* මඟින් සංශෝධිත ශ්‍රී ලංකා මිනින්දෝරු සේවා ව්‍යවස්ථා සංග්‍රහය පහත දැක්වෙන ආකාරයට සංශෝධනය විය යුතුය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

එම්. ඒ. බී. දයා සෙනරත්,<br>
ලේකම්,<br>
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2019 අප්‍රේල් මස 08 දින<br>
රාජ්‍ය සේවා කොමිෂන් සභාව,<br>
අංක 1200/9, රජමල්වත්ත පාර,<br>
බත්තරමුල්ල.

7.3 "II/II පන්තියේ සහකාර මිනින්දෝරු අධිකාරීන්/මිනින්දෝරුවරුන් ලෙස සේවය කරන නිලධාරීන් ඔවුන් II/II හි අවුරුදු 10ක සේවා කාලයක් සම්පූර්ණ කරන අවස්ථාවේදී 2 වැනි කාර්යක්ෂමතා කඩඉම සමත් වී නොමැති නම් සහ පූර්වාසන්න අවුරුදු 5 ක කාලයක් තුළ සතුටුදායක සේවාවක් සම්පූර්ණ කර ඇතිනම් අනෙකුත් සහකාර මිනින්දෝරු අධිකාරීන්ගේ ජ්‍යෙෂ්ඨත්වයට හානි නොවනසේ සහ තවදුරටත් I පන්තියේ පත්වීම සඳහා හිමිකම් නොමැති වන සේ II/I පන්තියට උසස් කෙරේ. මෙම සහනය මෙම ව්‍යවස්ථා සංග්‍රහය ක්‍රියාත්මක වන 2005.08.01 දිනට සහකාර මිනින්දෝරු අධිකාරීන් / මිනින්දෝරුවරුන් ලෙස සේවය කරන නිලධාරීන්ට පමණක් අදාළ වේ."

මෙම සංශෝධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2018.12.24 දිනැති අංක 2103/2 දරණ *අති විශෙෂ ගැසට් පත්‍රය* මඟින් පළ කරන ලද ශ්‍රී ලංකා මිනින්දෝරු සේවා ව්‍යවස්ථා සංග්‍රහය ක්‍රියාත්මක වන 2018.12.24 දින දක්වා පමණක් බලාත්මක වේ.

05 - 286

1A - G 29970 — 20 (2019/04)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*